# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2215/59 - 2021 පෙබරවාරි මස 19 වැනි සිකුරාදා - 2021.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකයඃ පීඑස්/සීඑස්ඒ/00/1/14/28.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

1. ගරු ධම්මික ප්‍රියන්ත සමරකෝන් ජයවර්ධන මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර

2. ගරු බේමා කුමුදිනී වික්‍රමසිංහ මැතිතුමිය
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර

වෙත,

සුභාශිංසන පූර්වකවයි !

1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2021 ජනවාරි මස 28 වන දිනැති අධිකාර පත්‍රය මගින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති බැවින් ද,

තවද, එකී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජික අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු රත්නප්‍රිය ගුරුසිංහ මැතිතුමා සිය ධුරයෙන් ඉල්ලා අස් වී ඇති හෙයින් ද,


1A - G 33761 — 385 (2021/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද, එමගින් ඇති වූ පුරප්පාඩුව පිරවීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, 1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු ආර්.එම්. සෝභිත රාජකරුණා මැතිතුමා ඉහත කී අධිකාරී පත්‍රය ප්‍රකාර ස්ථාපනය කරනු ලැබූ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ලෙස මෙයින් පත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිඑකක් වූ පෙබරවාරි මස 18 වන දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමා ගේ නියමය පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.